**කැලණිය ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1. **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

කැලණිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කැලණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5. **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම**

| **අදාල ප්‍රමිතයට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 3.15 | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාර ප්‍රාදේශීය සභාවේ අධිකාරිය ඇති ප්‍රදේශය, පිහිටා ඇති රට හා පළාත සහ එහි ප්‍රධාන කාර්යාලයේ ලිපිනය හෙළිදරව් කර නොතිබුණි. | වරද හඳුනාගත් අතර 2021 අවසන් ගිණුමෙන් එම හෙළිදරව්කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වේ. |

1.6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අංක 2155/8 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 83 (ii) අනුව සේවක ණය සඳහා අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | වරද හඳුනාගත් අතර අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කරමි. | අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යැමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | ප්‍රත්‍යාගණන උපලේඛනය අනුව සභාව සතුව පැවති ඉඩම් 96 න් පොදු නාන ළිං | පිලපිටියේ, වේවැල්දූවේ, මානෙල්ගම නිවාස ක්‍රමයේ , | සභාව සතු සියළු ඉඩම් හඳුනාගෙන |

| | | | |
|---|---|---|---|
| | 6 කට අදාල ඉඩම් 6 ක් භෞතිකව දක්නට නොතිබූ අතර සභාව සතු එක් ඉඩම් කොටසක් තෑගි ඔප්පුවක් මගින් වෙනත් පුද්ගලයෙකුට පවරා දී තිබුණි | නුවර පාරේ බුළුගහහන්දිය පොදු නාන ළිං සහ වනාතෙවත්ත ඉඩම පවරා ඇත. වනවාසල ක්‍රීඩාපිටිය දක්නට නොමැත. ඊරියවැටිය දේව සුමිත්තාරාම පාර නාන ළිඳ භෞතිකව නොමැති වීම නිසා අගය නිගමනය කල නොහැක. මැවැල්ල ළදරු පාසල, මහජන පුස්තකාලය හා ළමා උයන නැවත ප්‍රතිසංස්කරණය කරන නිසා අගය නිගමනය කල නොහැකි වුණි. වේවැල්දූව අභය මාවතේ අභය සිරිවත්ත අසල නාන ළිඳ ප්‍රත්‍යාගණන ඉඩම් ලේඛනයේ ගොරොක්ගහවත්ත ඉඩමට සම්බන්ධ කොටසකි.ඉඩම ප්‍රත්‍යාගණනය සිදු කර ඇත. | වටිනාකම අගයකර ගිණුම්ගත කිරීමටත් සභාව සතු ඉඩම් තෑගි ඔප්පු මගින් ප්‍රදානය කළ හැකිද යන්න පිළිබඳව සොයා බලා ඒ සම්බන්ධයෙන් කටයුතු කළයුතු වේ. |
| (ඇ) | ණය හිමියන් ලෙස උපලේඛනයේ දක්වා ඇති රු.7,000,000 ක් වටිනා විදුලි ජනන යන්ත්‍රයක් ගිණුම් ගත කර නොතිබුණි. | 2021 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. | වත්කම් සියල්ල ගිණුම් ගත කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඈ) | ගිණුම් විෂයයන් 08 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ උපලේඛන අනුව පැවති වෙනස උපලේඛන ශේෂයට ගලපා සංචිත හා වෙන්කිරීමේ ගිණුමට මාරුකිරීම හේතුවෙන් රු.109,383,228 කින් සංචිත ශේෂය වෙනස්වී තිබුණි. | අදාළ විෂයයන් සමඟ එම ශේෂ නොසැසඳීම් ගැලපීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර , එම වැරදි නිවැරදි කරන තෙක් නව ගිණුම් ක්‍රමයට අනුව තාවකාලිකව සංචිත හා වෙන්කිරීම් ලෙස ගිණුමක් විවෘත කළ අතර පසුව සිදු කරනු ලබන නිවැරදිකිරීම් එම සංචිත හා වෙන්කිරීම් ගිණුම හරහා සිදු කරනු ලබයි. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර ශේෂයන්හි වෙනසක් නොපැවතිය යුතු අතර විධිමත් අධිකාරි බලයක් තුලින් පමණක් සංචිත ගිණුමට මාරු කිරීම කළයුතු වේ. |
| (ඉ) | 2020 වර්ෂයේ එකතුව රු.2,233,236 ක් වූ ස්ථාවර වත්කම් බැහැර කර තිබූ නමුත් ඒ සඳහා ක්ෂය ලෙස බැහැර විය යුතු රු.254,200 ක් ගලපා නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් අතිරික්තය අඩුවෙන් දක්වා තිබූ අතර ක්ෂය වටිනාකම ඉවත්කිරීමේ ගිණුමට හා ක්ෂය වෙන් කිරීමේ ගිණුමට ගලපා නොතිබුණි. | වරද හඳුනාගත් අතර ඉවත් කරන ලද වත්කම් සම්බන්ධයෙන් කරන ලද ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ ඇති බැවින් එය 2021 වර්ෂයේදී සමුච්චිතයට බැර කරන බව කාරුණිකව දන්වමි. | ඉවත්කරන වත්කම් වලට අදාල ක්ෂය වෙන්කිරීමද නිසි පරිදි ගැලපීමට කටයුතු කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.197,745,162 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.94,173,429 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.733,489 ක් වූ උත්සවශාලා කුලී වටිනාකමින් වර්ෂයේ අවසන් දින වනවිට කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. ප්‍රවර්තන වර්ෂයට රු.430,000 ක් බිල්කර තිබුණද එම බිල්කිරීම් වලින් රු.373,000 ක් පමණක් අයකර තිබුණි. | 2020 වර්ෂයේ මාර්තු මස සිට කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කුලී අයකිරීම් ඉතා අඩු මට්ටමින් සිදුවිය. | හිඟ උත්සවශාලා කුලී අයකරගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.637,533 ක් වූ වෙනත් ස්ථාන හිඟකුලී වලින් වර්ෂයේ අවසන් දින වන විට කිසිදු මුදලක් රැස්කරගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ මාර්තු මස සිට කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කුලී අයකිරීම් ඉතා අඩු මට්ටමින් සිදුවිය. | වෙනත් ස්ථාන හිඟකුලී අයකරගැනීමට කටයුතු කළයුතු වේ. |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව හිඟ වරිපනම් ශේෂය රු.47,628,734 ක් සහ මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ වරිපනම් රු.43,536,497 ක් වූයෙන් රු.4,092,237 ක වෙනසක් පවතින බවද, වරිපනම් බදු එක් ඒකකයක වර්ෂ 04 ක පමණ කාලයක සිට අය නොවී පවතින රු.787,040 ක හිඟයක් පවතින බවද, සමාලෝචිත වර්ෂයේ වැඩියෙන් බිල්කර තිබුණ වටිනාකම රු.118,300,000 ක් බවද, නිරීක්ෂණය විය. | ශේෂය පිරික්සමින් පවතින අතර රටේ පැවති කොවිඩ් 19 වසංගතය නිසා හිඟ මුදල් අයකර ගැනිමට සහ දේපල තහනම් කිරිමේ කටයුතු සිදු කිරීමට නොහැකි විය. දීර්ඝ කාලීනව අදාල ආයතනය වසා පවතින බැවින් මේ වන විට වරිපනම් ලේඛනයේ බිල්කිරිම් නවතා දමා, ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. 2020 වර්ෂයට තොරතුරු ලබාදීමේදී, බිල් කිරීම් වල ගිණුම්කරණ දෝෂය සිදුව ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කර ගැනීමට ද , හිඟ වරිපනම් බදු අයකර ගැනීමටද, ආදායම් බිල්කිරීම් නිවැරදිව සිදු කිරීමටද කටයුතු කළයුතු වේ. |

### 2.2.3 කඩකුලී

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සභාව සතු කඩ කාමරවලින් රු.16,546,626ක හිඟයක් පැවති අතර, මෙම හිඟ ශේෂය තුල කඩ කාමර දෙකකින් අයවියයුතු රු.643,245 ක කඩ කාමර කුලියක් වසර 03 ක පමණ කාලයක සිට අයකරගෙන නොතිබුණි. | කොවිඩ් වසංගතය පහව ගිය පසු හිග මුදල් අයකර ගැනිමට කටයුතු කරමි. | හිඟ කඩ කාමර කුලී අයකරගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | කඩ කුලී වටිනාකම රු.113,078,355 ක් සඳහා කඩ කුලී ලේඛනය සහ විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් නොවූ අතර , කඩ කුලී සහ මස් කඩ කුලී ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 18,741,872 ක් හා අනුරූපී | ශේෂය පිරික්සමින් පවතියි. උප ලේඛන ඉදිරිපත් කිරීමට ඇත | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කරගැනීමට සහ ගිණුම්ගත කරන ලද සියළුම වටිනාකම් සඳහා ලිඛිත සාක්ෂි |

| | | |
|---|---|---|
| වාර්තා අනුව රු.115,648,294 ක් වූයෙන්, රු.96,906,422 ක වෙනසක් නිරීක්ෂණය විය. | | ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

2.2.4 **වෙනත් ආදායම්**

**සම්ප්‍රේෂණ කුළුණු ආදායම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට සම්ප්‍රේෂණ කුළුණු 54 ක, අය කර ගත යුතුව පැවති කුළුණු ආදායම රු.132,000 ක් අයකර ගෙන නොතිබුණු අතර , මෙම කුළුණු වලින් වාර්ෂික තක්සේරුවක් මත වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා බල ප්‍රදේශයේ කුළුණුවල වාර්ෂික තක්සේරුවක් 2019 වර්ෂයේ අග භාගයේදී සිදුකරන ලද අතර, එයින් සියයට හැත්තෑපහක පමණ ප්‍රමාණයක් නිම කර ඇති බවත්, කොවිඩ් වසංගතය පහව ගිය පසු තක්සේරු කටයුතු අවසන් කරමි. | හිඟ සම්ප්‍රේෂණ කුළුණු ආදායම් රැස්කරගැනීමට කටයුතු කළයුතු අතර නව තක්සේරු කරනතුරු පැරණි තක්සේරුවට හෝ කුළුණු වලින් වාර්ෂික තක්සේරුවක් මත වරිපනම් බදු අයකිරීමට කටයුතු කළයුතු වේ. |